# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/71 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ, ලුණුපොකුණ කොට්ඨාසයේ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු ඉඩම, අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 අගෝස්තු මස 31 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරු පාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ ලුණුපොකුණ කොට්ඨාසයේ පිහිටියාවූද, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අංක A5353 හා 1964.06.20 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 01 සිට 04 දක්වා සවිස්තරව පෙන්නුම් කර ඇත්තාවූද, අක්කර 02, රූඩ් 00, පර්චස් 22.13 ක් වූ පහත සඳහන් මායිම්වලින් සමන්විත ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අලුත්මාවත පාර, ඇල සහ පී. පී. ඒ. 2948 හි කැබලි අංක 09 ; |
| *නැගෙනහිරට* | : | පී. පී. ඒ. 2948 හි කැබලි අංක 9 සහ පී. පී. ඒ. 2948 හි කැබලි අංක 08 ; |
| *දකුණට* | : | පී. පී. ඒ. 2948 හි කැබලි අංක 7 සහ අලුත් මාවත පාරේ, වරිපනම් අංක 266, 262/1 සිට 262/16 දක්වා සහ 262 ; |
| *බටහිරට* | : | පාර, අලුත් මාවත පාරේ වරිපනම් අංක 266, 262/1 සිට 262/16 දක්වා සහ 262, අලුත් මාවත පාරේ වරිපනම් අංක 254, අලුත් මාවත පාරේ වරිපනම් අංක 250/6 දරන ස්ථාන. |

11 - 1267


1A - G 24548 — 09 (2016/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොටහේන කොට්ඨාසයේ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු ඉඩම, අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 20 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරු පාය'' බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොටහේන කොට්ඨාසයේ පිහිටියාවූද, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අංක 414771 හා 1931.05.06 දිනැති සැලසුමෙහි කැබලි අංක 01 සිට 08 දක්වා සවිස්තරව පෙන්නුම් කර ඇත්තාවූද, අක්කර 02, රූඩ් 03, පර්චස් 27.77 ක් වූ පහත සඳහන් මායිම්වලින් සමන්විත ඉඩම :

*උතුරට* : ඒ. පී. කාසිචෙට්ටි හිමිකම් පවසන ගොරකගහ කුඹුර සහ ගොරකගහ වත්ත ;

*නැගෙනහිරට* : වාසල පාර, ලොයිසා ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් පවසන වරිපනම් අංක 65 දරන ස්ථානය, ක්‍රිස්ටිනා ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් පවසන වරිපනම් අංක 66 දරන ස්ථානය සහ ලොයිසා ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් පවසන වරිපනම් අංක 67 දරන ස්ථානය ;

*දකුණට* : පන්සල පාර ;

*බටහිරට* : ටී එම්. ප්‍රනාන්දු හිමිකම් පවසන වරිපනම් අංක 74 සහ 80 දරන ස්ථානයෙන් කොටසක්.




Scale of 2 Chains to an inch.

# PLAN

## OF AN ALLOTMENT OF LAND.

**Being part** of Premises bearing Assessment Nos. 74 & 80 & Premises bearing Assessment Nos. 73, 71, 72, 63, 62 & 64

In Kotahena, within the Municipal Limits of Colombo.

**COLOMBO DISTRICT,**

# WESTERN PROVINCE.

***Bounded as follows :—***

**North** by Gorakagahakumbura & Gorakagahawatta claimed by A.P. Casie Chett

**East** by Wasala Road, Premises bearing Assessment Nos. 65 claimed by Louis Fernando & others, 66 claimed by Christina Fernando & others & 6 claimed by P. Louisa Fernando & others.

**South** by Pansala Road.

**West** by the remaining portion of Premises bearing Assessment Nos. 74 & 8 claimed by T.M. Fernando.

| | A. | R. | P. |
|---|---|---|---|
| CONTAINING IN EXTENT | 2. | 3. | 27.77 |

Acres Two, Roods Three, Perches Twenty-sev & seventy-seven hundredths of a Perch.

G.A's 1796
Applied for 5.2.1931.
Drawn by ...
Written " ...
Examd. " ...

" True copy of the original plan signed by the Surveyor-General.
Colombo. 6th May, 1931.

Officer specially authorised by the Surveyor-General to countersign "

**SURVEYOR-GENERAL'S OFFICE,**

Colombo, 6th May, 1931.

Sgd/ G. K. Thornhill.

Actg. Surveyor-General.

11 - 1268